රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
பொது நிருவாக, அனர்த்த முகாமைத்துவ மற்றும் கால்நடை அபிவிருத்தி அமைச்சு
**Ministry of Public Administration, Disaster Management and Livestock Development**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி:**(94) 011- 2694560** / Telephone
ෆැක්ස් / தொலைநகல்:**(94) 011- 2692254** / Fax
ඊ-මේල් / மின்னஞ்சல்:**dgcs@pubad.gov.lk** / E-mail
වෙබ් අඩවිය / இணையதளம்: **www.pubad.gov.lk** / Web Site


මගේ අංකය / எனது இல / My No: COM/Trans/වා.ස්.මා./2020
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2019.10.24

අමාත්‍යාංශ ලේකම්වරුන්,
දිස්ත්‍රික් ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

## 2020 වාර්ෂික ස්ථාන මාරුවීම් - ( ඒකාබද්ධ සේවය)
## රජයේ භාෂා පරිවර්තක සේවය, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය, සංවර්ධන නිලධාරී සේවය, ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය, කළමනාකරණ සේවා නිලධාරී සේවය, ඒකාබද්ධ රියදුරු සේවය, කාර්යාල සේවක සේවය.

මේ සමග අමුණා ඇති උපලේඛනයේ සඳහන් මාරුවීම් 2020.01.01 දින හෝ නිලධරයන්ගේ නම්වලට ඉදිරියෙන් දක්වා ඇති දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත කරමි. මේ බව අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / කාර්යාලයේ අදාල නිලධරයන් වෙත දන්වා නියමිත දිනයේදී අභිනව කාර්ය ස්ථානයේ වැඩ භාර ගන්නා ලෙස ඔවුන්ට දැනුම් දෙනු මැනවි. රාජ්‍ය සේවා කොමිෂන් සභාව / අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව / මැතිවරණ කොමිෂන් සභාව යන ස්ථානවලට ස්ථාන මාරු කරන ලද නිලධරයන්ගේ ස්ථාන මාරු ක්‍රියාත්මක විය යුත්තේ අදාල ආයතන ප්‍රධානීන්ගේ එකඟත්වයට යටත්ව බවද දන්වමි.

02. දැනට සේවය කරන කාර්ය ස්ථානයේ නියමිත කාලය සම්පූර්ණ කර නොමැති නිලධරයන්ට මෙම වාර්ෂික ස්ථාන මාරු වෙනුවෙන් ගමන් වියදම් ගෙවනු නොලැබේ. නියමිත කාලය සම්පූර්ණ කර ඇති නිලධරයන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට යටත්ව ගමන් වියදම් ගෙවිය යුතු වේ. උපවේශන දීමනා ගෙවනු නොලැබේ.

03. ඒකාබද්ධ සේවයේ ස්ථානමාරු නියෝගවලට යටත් යම්කිසි නිලධරයෙකුට ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ කාර්යාලයේ පිහිටුවා ඇති අභ්‍යන්තර ස්ථාන මාරු මණ්ඩල මගින් ද අභ්‍යන්තර මාරු කිරීම් සඳහා නියෝග නිකුත්කර ඇත්නම් එහිදී ඒකාබද්ධ සේවායේ ස්ථාන මාරු නියෝගයන් ක්‍රියාත්මක විය යුතු වේ. එසේ වුවද නිලධරයන්ගේ ඉල්ලීම මත අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු / කාර්යාල අවශ්‍යතාවයන් මත අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු/ කාර්යාල විසින් දී ඇති ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක විය යුතු යැයි ඔබ අදහස් කරන්නේ නම් 2019.11.07 දිනට පෙර ඔබගේ නිර්දේශ ද ඇතිව අදාල ඉල්ලීම සම්බන්ධයෙන් වැඩිදුර උපදෙස් ලබා ගැනීම මැනවි.

04. මෙම ස්ථාන මාරුවීම් සිදු කිරීමේදී මාරුවීම් කමිටුව විසින් අනුගමනය කරන ලද ස්ථාන මාරු පටිපාටිය, 2019.06.27 දිනැති අංක 03/2019 දරන ඒකාබද්ධ සේවා චක්‍රලේඛය සමග මේ වන විටත් ඔබ වෙත එවා ඇත. මේ සමග ඇති ස්ථාන මාරුවීම් නියෝග, මාරුවීම් ඉල්ලා තිබූ සියළුම නිලධරයන්ට දැනගැනීමට සැලැස්විය යුතු වේ. මෙම ස්ථාන මාරු නියෝගවලට යටත් නිලධරයෙකුට 2019.12.31 දින දක්වා කල් දමන ලද මීට ඉහතදී නිකුත් කර ඇති ස්ථාන මාරු නියෝගයන් වේ නම් එවැනි නිලධරයකුට නැවත 2020 වාර්ෂික ස්ථාන මාරු නියෝග මගින් වෙනත් ස්ථාන මාරු නියෝගයක් ලබාදී ඇත්නම් එහිදී පෙර ස්ථාන මාරු නියෝගය බල රහිත වන බව සලකන්න.

05. ස්ථාන මාරු පටිපාටියෙහි හෝ ඒකාබද්ධ සේවා චක්‍රලේඛ අංක 03/2019 හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 1) හි XVIII පරිච්ඡේදයේ විධිවිධානවලට අනුකූලව හා ඒකාබද්ධ සේවා චක්‍රලේඛ අංක 03/2019 හි 6.2 හි සඳහන් කරුණු පරිදි තමන්ගේ ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳව වාර්ෂික ස්ථානමාරු කමිටුවේ අවධානයට යොමු වී නොමැත්තේ නම් පමණක් වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව වෙත කරුණු ඉදිරිපත් කළ හැකිය. රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/APL/07/14/2013 හා 2013.09.13 දිනැති ලිපියෙහි නියෝග අනුව වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටු තීරණය ලබා දීමෙන් පසුව නැවත සිදුකරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දීමෙන් අනතුරුව ඉදිරිපත් කරනු ලබන අභියාචනා, දුක් ගැනවිලි හෝ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ නිර්දේශ මත වාර්ෂික ස්ථාන මාරු තීරණ නියමිත දිනෙන් පසුවට කල් දමනු නොලැබේ. වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වූ අභියාචනාවකට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දුන් තීරණයන්, එකී තීරණ ක්‍රියාත්මක වීම වලකාලන නියෝගයක් නොමැති නම් වහාම ක්‍රියාත්මක කල යුතුය.

06. **රජයේ භාෂා පරිවර්තක සේවය, ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය, ඒකාබද්ධ රියදුරු සේවය, කාර්යාල සේවක සේවය යන සේවාවන් සඳහා** කරුණු දැන්වීමේ ඉල්ලුම් පත්‍රයෙහි ආදර්ශ ආකෘති පත්‍රයක් (ඒ.සේ./වා.ස්.මා/04) මේ සමග අමුණා ඇත. ඉල්ලීම් සම්බන්ධයෙන් සළකා බැලීමට එම ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කර ගත් **ඉල්ලුම්පත් 2019.11.07 දිනට ප්‍රථම** එවිය යුතු බව කාරුණිකව දන්වමි. (අයදුම් පත්‍රය සකස් කිරීමේදී එකම කොළයේ දෙපසම භාවිතා කරන්න) එදිනට පසුව ලැබෙන ඉල්ලීම් පිළිබඳව සළකා නොබලන බවද අදාල නිලධරයන්ට දැන්විය යුතු වේ. තවද ස්ථානමාරු ලේඛනයේ අදාල නිලධරයා ඉදිරියෙන් සඳහන් කර ඇති සේවක අංකය (Employee No.) ඉල්ලුම්පතේ සඳහන් කර නොමැති අයදුම්පත් සළකා බලනු නොබලන බවද දන්වමි.

07. තවද **සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන්** http://203.94.94.214/miscod/ ඔස්සේද **ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ හා කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධාරීන්** http://203.94.94.214/misco/ ඔස්සේද මාර්ගගත මෘදුකාංගය (Online Application) තුලට පිවිස අදාළ තොරතුරු 2019.11.07 දිනට පෙර ඇතුළත් කර එම අයදුම්පතෙහි පිටපතක් ආයතන ප්‍රධානියා මඟින් වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුව වෙත යොමු කරන ලෙස කාරුණිකව දන්වමි. තවද ඉහත වෙබ් ලිපින ඔස්සේ ආයතන ප්‍රධානියාට මෙම සේවාවන්ට අදාළව තම ආයතනයෙන් පිටතට වාර්ෂික ස්ථාන මාරු ලද නිලධාරීන්ගේ නාමලේඛනයන් හා ආයතනය වෙත පිටතින් ස්ථාන මාරු ලබන නිලධාරීන්ගේ නාමලේඛනයන් ලබා ගත හැකි බව වැඩි දුරටත් දන්වා සිටිමි.

08. ඔබ අමාත්‍යාංශයෙන් / දෙපාර්තමේන්තුවෙන් / කාර්යාලයෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබාදී ඇති නිලධාරීන්, **අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන** නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරී භාරගැනීමට හැකි වන සේ මුදා හැරීමට කටයුතු කරන ලෙස දන්වන අතර, මෙම ස්ථාන මාරුවීම් ප්‍රමාදයෙන් තොරව ක්‍රියාත්මක කළ යුතු බැව් ද දන්වමි. විධිමත් අනුමැතියකින් තොරව මෙම ස්ථාන මාරුවීම් නියෝග පැහැර හැර සිටින නිලධාරීන් සම්බන්ධයෙන් අංක 03/2019 චක්‍රලේඛයේ 9.8 වගන්තිය අනුව කටයුතු කල හැකි බවද දන්වමි.

09. තවද 2020 වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීමේදී අමාත්‍යාංශ වෙනස් වීම හේතුවෙන් යම් නිලධාරියෙක් ස්ථාන මාරු විය යුතු සේවා ස්ථානය පිළිබඳ ගැටළුවක් පවතී නම් එවැනි අවස්ථාවලදී අදාළ නිලධාරියා අනුප්‍රාප්තිකයා වශයෙන් සලකනු ලබන නිලධාරියාගේ සේවා ස්ථානය ඔහුගේ/ඇයගේ නව සේවා ස්ථානය විය යුතු බව දන්වමි.

10. මැතිවරණ කොමිෂන් සභා ලේකම්ගේ අංක HC/SO/PRE/EDR 1/1 හා 2019.10.14 දිනැති ලිපියේ අනුමැතිය පරිදි ඒකාබද්ධ සේවයේ 2020 වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කරන බව කාරුණිකව දන්වා සිටිමි.

**කේ.වී.පී.එම්.ජේ. ගමගේ**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

| ඒ.සේ. /වා.ස්.මා. /04 |
|---|

**2020 වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් සමාලෝචන කමිටුව වෙත කරණු දැක්වීමේ ඉල්ලුම් පත්‍රය**

| | | | |
|---|---|---|---|
| තනතුර හා පන්තිය | | ඉමානව සම්පත් අංකය- (ඒ.සේ.අ.ජ.ගේ මාරුවීම් ලේඛනයේ සේවක අංකය) | |

අ. පෞද්ගලික තොරතුරු

| | | | |
|---|---|---|---|
| 01. මුලකුරු සමඟ නම -: | | | |
| 02. උපන් දිනය -: YYY/MM/DD | 03.වයස (2019.12.31දිනට)-: අවු…………මාස……….දින…….. | 04. ජාතික හැඳුනුම්පත් අංකය -: | 05. ස්ත්‍රී /පුරුෂ භාවය -: |
| 06. ස්ථිර ලිපිනය -: | 07 .තාවකාලික ලිපිනය:- | 08 දුරකතන අංකය කාර්යාලය:- පෞද්ගලික:- | |
| 09 විවාහක/ අවිවාහක බව -: | 10 කලත්‍රයාගේ නම-: | 11කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය -: | |
| 12 දරුවන් ගණන -: | 13 ඔවුන්ගේ වයස -: | 14 ඉගෙනුම ලබන පාසල -: | |

ආ. සේවා තොරතුරු

| | |
|---|---|
| 15 ඒ.සේ.අ.ජ.ගේ පත්වීම් ලිපියේ අංකය-: | |
| 16 වර්තමාන සේවා ස්ථානය -: | 17. සේවා ස්ථානය පිහිටි නගරය-: |
| 18 වර්තමාන සේවා ස්ථානයට වාර්තාකල දිනය :- YYYY/MM/DD | 19 වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය -: (2019.12.31 දිනට) අවු…………..මාස……….දින…… |
| 20. ප්‍රතිලාභ ලබන සේවා ස්ථානයක සේවය කර තිබේද? (ප්‍රියමනාප) | |

| 21. රජයේ සේවයේ පූර්ව සේවා ස්ථාන | | සේවා ස්ථානය | තනතුර | සේවා කාලය | |
|---|---|---|---|---|---|
| | | | | සිට | දක්වා |
| | 1 | | | | |
| | 2 | | | | |
| | 3 | | | | |
| | 4 | | | | |

ඈ ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳ තොරතුරු (අදාළ කොටුවේ √ ලකුණ යොදන්න)

| | | | | |
|---|---|---|---|---|
| 22 | වාර්ෂික ස්ථාන මාරු අයදුම් කර | ඇත | | ස්ථාන මාරු ලැබී තිබේනම් එම සේවා ස්ථානය ..................................................................................... |
| | | නැත | | |

**23.** සමාලෝචන කමිටුව මගින් අපේක්ෂිත තීරණය

| | | |
|---|---|---|
| ස්ථාන මාරුව අවලංගු කිරීම | | ස්ථාන මාරුව සංශෝධනය කල යුතු/ නව ස්ථාන මාරු වීමක් ලබා දිය යුතු සේවා ස්ථාන |
| සංශෝධනය කිරීම | | 1................................................................. |
| නව ස්ථාන මාරුවක් ලබා ගැනීම | | 2................................................................. <br> 3................................................................. |

**24.** ඉදිරිපත් කිරීමට ඇති කරුණු

| |
|---|
| |

ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

................................ ..............................

දිනය අත්සන

---

ඇ. අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

- ඉහත නම සඳහන් නිලධාරියාගේ **2020** වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් සමාලෝචන කමිටුව වෙත කරුණු දැක්වීමේ ඉල්ලුම් පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි.

................................ ................................

දිනය අත්සන

නිල මුද්‍රාව